

# 26

# සහාබිවරු

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා සෘජුව දක එතුමා පිළිගෙන පිළිපදින ජනයා 'සහාබි' යනුවෙන් හඳුන්වනු ලැබේ. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ මිතුරන් අතරින් අබ්දුල්ලාහ් යන නමින් බොහෝ පිරිසක් සිටියහ. ඔවුන් අතරින් සිව් දෙනෙකුගේ ඉතිහාසය පිළිබඳ ව කෙටියෙන් විමසමු.

## 01. අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් රළියල්ලාහු අන්හු

වරක් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ද, එතුමාගේ මිත්‍ර අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමාණෝ ද කාන්තාරයේ ගමන් කරමින් සිටියහ. ඔවුනට දැඩි පිපාසයක් ඇති විය. එවිට උක්බා මුර්ද් නැමැත්තාගේ එළු රංචුව දක්කාගෙන යමින් සිටි කුඩා දරුවෙකු ඔවුන්ට දක්නට ලැබැණි. එම දරුවාට සමීප වූ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ " මඳක් කිරි ලබා දී මාගේ පිපාසය සංසිඳවිය හැකි ද?" යි විමසූහ. එවිට එම කුඩා දරුවා, "මෙය මා සතු දෙයක් නොවේ. මාගේ ස්වාමියාගේ ය. මා කෙරෙහි විශ්වාසයෙන් (අමානත්) පවරන ලද්දකි. ඔහුගේ අවසර නොමැතිව ලබා දිය නොහැක" යැයි පැවසුවේ ය. එම දරුවාගේ විශ්වාසය රැකීමේ ගුණය වර්ණනා කළ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ 'එක් කන්‍යා දෙනකගේ කිරි දෙවීමට අවසර දෙන්නේ ද?" යැයි විමසූහ. "කන්‍යා දෙනකට කිරි එරෙන්නේ නැත, හැකි නම් දෙවා ගන්න" යැයි කුඩා දරුවා පැවසුවේ ය. එම එළු දෙනගේ කිරි මඩිය තම දෑතින් පිරිමැද නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ යමක් උච්චාරණය කර කිරි මඩිය සෝද කිරි දෙවා ගත්හ.

එසේ දොවාගත් කිරි බී ඔවුහු පිපාසය සංසිඳුවා ගත්හ. පසුව "පෙර තත්ත්වයට ම පත්වන්න" යැයි පැවසුහ. විස්මයට පත් කුඩා ළමයා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ප්‍රකාශ කළ එම වචනය තමාට ද උගන්වන ලෙස ඉල්ලා සිටියේ ය. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ "ඔබ එය ඉගෙන ගන්නවා පමණක් නොව, ලෝකවාසී ජනයාට ද එය උගන්වන" යැයි ආශිර්වාද කළහ (මුස්නද් අහ්මද්) පසුව එම ළමයා ඉස්ලාමය වැළඳගෙන

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ සමීප මිතුරකු බවට පත් විය. එම දරුවා අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් රළියල්ලාහු අන්හු තුමා ය.

ළමා කාලයේ පියා අහිමි වූ ඔහු උක්බා බින් මුඊද් නැමැත්තාගේ එඬේරකු ලෙස සේවය කළේ ය. ඔහු තුළ සරල බව, මහන්සි වී ඉපැයීම, විශ්වාසය රැකීම යන උසස් ගුණාංග දක්නට ලැබිණි. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා සමග මොහු අන්‍යෝන්‍ය ලෙස සමීපව ආශ්‍රය කළේ ය. වැඩි දෙනෙක් ඔහු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ පවුලේ සාමාජිකයකු යැයි ද සිතුහ.

## 02. අබ්දුල්ලාහ් ඉබ්නු උමර් රළියල්ලාහු අන්හු

කලීෆා උමර් රළියල්ලාහු අන්හු තුමාට ද, සෛනබ් බින්ති මල්ඌන් තුමියට ද දාව අබ්දුල්ලාහ් ඉබ්නු උමර් රළියල්ලාහු අන්හු තුමා නුබුව්වත් දෙවන වසරේ මක්කාවේ දී උපත ලැබුවේ ය. මෙතුමා, තම පියා සමඟ නුබුව්වත් 6 වෙනි වසරේ දී ඉස්ලාමය වැළඳ ගත්තේ ය. දසවන වියේ දී මදීනාවට හිජ්රත් කළේ ය. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ හදීස් අධික වශයෙන් "රිවායත්" කළ පුරුෂයන් අතර දෙවැන්නා මොහු වේ. මෙතුමා මඟින් හදීස් 2630ක් පමණ හිමි විය. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාගේ ජීවන රටාව පිළිපැදීමෙහි ලා මෙතුමා සුපරීක්ෂාකාරී විය.

කලීෆා තුමාගේ පුතා ලෙස කිලාෆතය භාරගැනීමට මෙතුමා සුදුස්සෙකු ලෙස සිටියේ ය. මෙතුමාට කිලාෆත් පාලනය භාර ගන්නා ලෙස සමහරු පැවසුව ද "මා ඉබ්නු උමර් ලෙස ම මියැදීමට කැමැත්තෙමි" යැයි පැවසුවේ ය. මෙලොව කාර්යයන්ගෙන් ඉවත්ව ජීවත් වීමට එතුමා ප්‍රිය කළේ ය. වරක් තරුණයින් සිව් දෙනෙකු කෑබාවෙහි රුක්නුල් යමානි අල්ලාගෙන ඉල්ලීම් එකිනෙක ඉදිරිපත් කර දුක්ගැනවිලි පැවසූ විට ඉබ්නු උමර් රළියල්ලාහු අන්හු තුමා "ඔබේ කරුණාව මුල් කරගෙන අයැද සිටින්නෙමි, යා අල්ලාහ් පරමාන්ත දිනයේ දී ස්වර්ග ජීවිතයෙන් මුදවා මා අසරණ ලක් නොකරන්න." යැයි ප්‍රාර්ථනා කළේ ය.

ඉබ්නු උමර් රළියල්ලාහු අන්හු තුමා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගෙන් සෘජුව ඉගෙන ගත්තා පමණක් නොව, පියාගෙන් ද සහෝදරිය වන හෆ්සා රළියල්ලාහු අන්හා තුමියගෙන් ද, අල් කුර්ආන් හා හදීස් විවරණයන් ඉගෙන ගත්තේ ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි දැඩි උද්යෝගයක් දැක්වූ මොහු තම ජ්‍යෙෂ්ඨ සිසුවකු වූ නාබිඋ යන සිසුවා කැඳවා තමා උගත් දේ ඔහුට ද ඉගැන්නුවේ ය. රාත්‍රි නැමඳුමෙහි ද, දීර්ඝ වේලාවක් තිලාවත්හි ද නිරත වූ මෙතුමන් තැන්පත් හා දයාලු බවින් හෙබි පුද්ගලයෙකු ලෙස දක්නට ලැබුණි. ආගන්තුක සත්කාරයට ඇල්මක් දැක්වූ මෙතුමා වහලුන් දහසක් පමණ නිදහස් කර ඇත්තේ ය. ඉබ්නු උමර් යහපත් චරිතයකින් යුත් කෙනෙකු ලෙස නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ පැසසුමට ද මොහු ලක්විය.

## 03. අබ්දුල්ලාහ් ඉබ්නු අබ්බාස් රළියල්ලාහු අන්හු

මෙතුමා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ මහප්පා වන අබ්බාස් රළියල්ලාහු අන්හු තුමාගේ ද, උම්මුල් ෆළල් තුමියගේ ද පුත්‍රයා ලෙස නුබුව්වත් 3 වන වසරේ දී මක්කාවේ උපත ලැබුවේ ය. මෙතුමා උපත ලැබූ විට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා වෙත ගෙන එනු ලැබී ය. "අබ්දුල්ලාහ්" යයි ඔහුට නම් තැබූ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා "කලීෆාවරුන්ගේ පියා" යැයි ඔහුට සුබ පැතීය.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ඉබ්නු අබ්බාස් රළියල්ලාහු අන්හු තුමාගේ කුඩම්මා වන මයිමූනා තුමිය විවාහ කර ගත්තේ ය. තම එකොළොස් හෝ දොළොස් වන වියේ දී මදීනාවට හිජ්රත් කළ ඉබ්නු අබ්බාස් රළියල්ලාහු අන්හු තුමා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා නිතර හමු වූවේ ය. එබැවින් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට සේවය කිරීමේ අවස්ථාව ද ඔහුට හිමි විය. එසේ ම මොහු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ ආදරයට හා ප්‍රශංසාවට ද ලක් වූයේ ය. එතුමාගේ දැනුම වර්ධනය සඳහා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ද ප්‍රාර්ථනා කළේ ය. එබැවින් පසු කාලයේ බහ්රුල් උඃලූම්, (දැනුම් සාගර) සෙයියදුල් මුෆස්සිරීන් යන නාමයෙන් ද එතුමා පිදුම් ලැබුවේ ය. හදීස් 1660ක් රිවායත් කළ මෙතුමා, තෆ්සීර් කලාවෙහි ශ්‍රේෂ්ඨයෙක් වූවේ ය.

දේශපාලන ක්ෂේත්‍රයට ද සම්බන්ධ වූ ඔහු අලි රළියල්ලාහු අන්හු තුමාගේ කාලයේ කලීෆා තුමාගේ උපදේශකයා ලෙස සේවය කළේ ය. ඉබ්නු සුබෙයිර් රළියල්ලාහු අන්හු තුමා මක්කාවේ කලීෆා ලෙස සිටි කාලයේ එම ස්ථානයෙන් පිට වී තායිෆ්හි පදිංචි වූයේ ය. එතුමා තම 71 වන වියෙහි වෆාත් වූයේ ය.

## 04. අබ්දුල්ලාහ් ඉබ්නු සුබෙයිර් රළියල්ලාහු අන්හු

මෙතුමා සුබෙයිර් ඉබ්නු අව්වාම් හා අස්මා බින්ති අබූබක්ර් රළියල්ලාහු අන්හා යන දෙපොළගේ පුත්‍රයා ලෙස මදීනාවේ උපත ලැබුවේ ය. මුස්ලිම්වරුන් මක්කාවෙ සිට මදීනාවට ගිය පළමු මාස විස්සෙහි කිසිඳු මුහාජිරීන්වරයකුට දරු සම්පත් හිමි වූයේ නැත. එලෙස දරුවන් හිමි නොවීමට යුදෙව්වන් හූනියම් කර ඇති බවට මතයක් ද පැතිරෙමින් තිබුණි. මෙවන් කාලයක ඉබ්නු සුබෙයිර් රළියල්ලාහු අන්හු තුමා මදීනාවේ මුහාජිරීන්වරුන්ගේ පළමු දරුවා ලෙස මෙලොව එළිය දුටුවේ ය.

මෙතුමා තුළ ඔහුගේ ළමා කාලයේ දී ම අසාමාන්‍ය එඩිතරකමක් දක්නට තිබුණි. හිජ්රි 5 වන වසරේ සිදු වූ "අහ්සාබ්" සටනේ දී පියා වූ සුබෙයිර් රළියල්ලාහු අන්හු තුමා සටනේ නිරත වන විට, අම්ර් බින් අබී සලාමා නැමැත්තාගේ පිටෙහි නැග පියාගේ වීර ක්‍රියාව නිරීක්ෂණය කළේ ය. යුද්ධය අවසන් වූ පසු පියා වෙත ගොස් "පියාණෙනි!, ඔබ තුමා අද සටන් කළ විලාසය මම බලා සිටියෙමි" යැයි ගාම්භීරව කියා පෑවේ ය.

කඃබාවේ රුක්නුල් යමානි අල්ලාගෙන අල්ලාහ් වෙත චෝදනා කළ සිව් දෙනාගෙන් මොහු ද එක් අයෙකි. "හිජාසයේ පාලනය අපට හිමි වී මාගේ කිලාෆතය ජනතාව පිළිගන්නා තුරු මා මරුමුවට පත් නොකරන්න" යැයි එතුමා නිතර ප්‍රාර්ථනා කළේ ය.

අල්ලාහ්, ඉබ්නු සුබෙයිර්ගේ ප්‍රාර්ථනාව ද පිළිගෙන ඔහු හිජාසයේ කලීෆා ලෙස ද පත් කළේ ය. ඔහු වසර 9ක පමණ කාලයක් මක්කාව පාලනය කළේ ය. පසුව මෙතුමා හජ්ජාජ් අබ්දුල් මලික්ගේ සේනාධිපති වූ ඉබ්නු යූසුෆ්ගේ ප්‍රහාරයෙන් සාහසික ලෙස ඝාතනයට ලක්වී වෆාත් විය.

## පාඩමෙහි අන්තර්ගත අරාබි වචන

الأَحْزَاب    رُكْنُ الْيَمَان    صَحَابَة    بَيْعَةٌ

## අභ්‍යාස

(අ)

1. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ............................ තුමා එඩේරයකු ලෙස දුටුවෝ ය.
2. ඉබ්නු සුබෙයිර් රළියල්ලාහු අන්හු තුමාගේ පියා ............................. තුමා විය.
3. ඉබ්නු උමර් රළියල්ලාහු අන්හු තුමාගේ මව .................................. තුමිය වූවා ය.
4. ඉබ්නු අබ්බාස් රළියල්ලාහු අන්හු තුමා .................................... ක්ෂේත්‍රය තුළ කීර්තියට පත් වූවේ ය.
5. ඉබ්නු සුබෙයිර් රළියල්ලාහු අන්හු තුමා .................................. ප්‍රිය කළේ ය.
6. හිජ්රතයට පසු මුහාජිර්වරුන්ට ලැබුණු ප්‍රථම දරුවා .................................. විය.

(ආ)

1. ඉබ්නු මස්ඌද් රළියල්ලාහු අන්හු තුමා තුළ දක්නට ලැබුණු උසස් ලක්ෂණ කවරේ ද?
2. ඉබ්නු උමර් රළියල්ලාහු අන්හු තුමාගේ විශේෂතා හතරක් සඳහන් කරන්න.
3. ඉබ්නු සුබෙයිර් රළියල්ලාහු අන්හු තුමාගේ එඩිතර ක්‍රියා දෙකක් සඳහන් කරන්න.
4. ඉබ්නු අබ්බාස් රළියල්ලාහු අන්හු තුමාගේ සේවා තුනක් ලියන්න.